# දරුවන් උදෙසා බයිබලයක්

## ආයුබෝවන් ඵාරාවෝ



ඉදිරිපත් කරන්නා: Edward Hughes

නිදර්ශනය කරන්නා: Janie Forest
Alastair Paterson

සකස්කරන්නා: Lyn Doerksen

පරිවර්ථනය කරන්නා

නිෂ්පාදනය කරන්නා: Bible for Children
www.M1914.org

©2023 Bible for Children, Inc.
අවසරය : මෙම කථාන්තරය උපුටා ගැනිමට හෝ මුද්‍රණය කිරීමට අවසර ඇතිමුත් එය විකිණීමට අවසර නැත.



ඵාරාවෝ
කෝප වූයේය.

දෙවියන් වහන්සේ මෝසෙස් හරහා
ඊශ්‍රායෙල් වහලුන් ඊජිප්තුවෙන්
පිටතට යවන ලෙස ඔහුට අණ කර
තිබේ. ඔහු ඒ අණ ප්‍රතික්ෂේප
කළේය. “ඔවුන්ව වඩාත් මහන්සි
වෙන ලෙස වැඩ කරවන්න”යැයි
ඵාරාවෝ වහලුන්ගේ
ස්වාමිවරුන්ට අණ දුන්නේය.
දැන් ඊශ්‍රායෙල්වරුන්ගේ
තත්වය තිබුණාටත්
වඩා නරක් විය.

“ඔබට අවශ්‍ය පිදුරු ඔබම සපයාගන්න. අපි තවදුරටත් ඒවා ලබා නොදෙන්නෙමු. නමුත් කලින් සෑදූ ගඩොල් ගණනම සෑදිය යුතුය.” ඒ ඵාරාවෝගේ අලුත් අණ විය.



පිදුරු එකතු කරන්නටත්
සිදුවීම නිසා ප්‍රමාණවත්
තරම් ගඩොල් සෑදීමට ඔවුන්ට
වෙලාවක් නැති වීමෙන් වැඩ
බලන නිලධාරිහු සමහර
වහලුන්ට කසයෙන්



පහර දුන්නෝය.



මිනිස්සු ඔවුන්ට සිදුවූ කරදර
නිසා මෝසෙස් හා ආරොන්
හට දොස් නැඟුවෝය.
මෝසෙස්ට යාච්ඤා
කරන්නට තැනක්
සම්බවිය. “අහෝ
ස්වාමින් වහන්ස”, ඔහු
මොර ගැසුවේය. “ඔබ
වහන්සේ ඔබගේ ජනතාව
මදක්වත් ගලවාගෙන
නැත.” “මම ස්වාමින්
වහන්සේය, මම ඔබ
සැමදෙනා පිටතට
ගෙනෙන්නෙමි” යි
දෙවියන් වහන්සේ
පිළිතුරු දුන් සේක.

ඉන්පසු නැවතත් දෙවියන් වහන්සේ, මෝසෙස් සහ ආරොන් දෙදෙනා ඵාරාවෝ වෙත යැවූ සේක. බලවන්ත පාලකයා දෙවියන් වහන්සේගේ සේවකයන්ගෙන්, උන්වහන්සේගේ

ළකුණක් ඉල්ලූ විට ආරොන්ගේ සැරයටිය ලිස්සා යන සර්පයෙකු බවට හැරුණේය.





“මාගේ විජ්ජා කාරයන් කැඳවව.” ඵාරාවෝ ගර්ජනා කළේය. ඊජිප්තු විජ්ජා කාරයන් ඔවුන්ගේ සැරයටි බිම දැමූ විට ඒවාද සර්පයන් බවට පත්විය. නමුත් සර්පයෙකු බවට හැරවුනු ආරොන්ගේ සැරයටිය අනෙක් සැරයටි ගිල දැමුවේය. එහෙත් ඵාරාවෝ මිනිසුන් නිදහස් කිරීම ප්‍රතික්ෂේප කළේය.

පසුදා උදයේ මෝසෙස් සහ ආරොන් දෙදෙනා ගඟ අසළදී ඵාරාවෝ හමු වූවෝය. ආරොන් තම සැරයටිය දිගුකළ විට දෙවියන් වහන්සේ වතුර ලේ බවට හැරවූ සේක. මත්සයයෝ මැරුණෝය. මිනිසුන්ට ඒ වතුර බොන්නට නොහැකි විය.



නමුත් ඵාරාවෝ ඔහුගේ සිත දැඩි කරගත්තේය. ඔහු ඊශ්‍රායෙල්වරුන්ට ඊජිප්තු දේශයෙන් පිටවන්නට ඉඩ නොදෙනු ඇත.





නැවතත් මෝසෙස්
මිනිසුන් නිදහස්
කරන ලෙස ඵාරාවෝට
කීවේය. ඵාරාවෝ
නැවතත් එය
ප්‍රතික්ෂේප කළේය.
දෙවියන් වහන්සේ
නවත් වසංගතයක්
එවූ සේක. මුළු ඊජිප්තු
දේශයම මැඩියන්ගෙන්
පිරී ගියේය. සෑම
නිවසක්ම,
කාමරයක්ම මෙන්ම
කෑම පිසින උදුන් පවා
මැඩියන්ගෙන් පිරී
ගියේය.



“දෙවියන් වහන්සේට මැඩියන් ඉවත් කරන පිණිස මා ගැන යාච්ඤා කරන්න. එවිට මම නුඹේ සෙනඟට යන්න දෙන්නෙමි” යි කියමින් ඵාරාවෝ බැගෑපත් විය. නමුත් මැඩියන් ගිය කළ, ඵාරාවෝ හිත වෙනස් කරගත්තේය. ඔහු වහලුන් නිදහස් නොකරනු ඇත.

එවිට දෙවියන් වහන්සේ බිලියන ගණනින් කිනිතුල්ලන් එවූ සේක. උන් දෂ්ඨ කිරීම නිසා සතුන් ඇතුළු සියලු දෙනාටම ශරීරවල කැසීම් හටගත්තේය. එහෙත් ඵාරාවෝ දෙවියන් වහන්සේට යටත් වූයේ නැත.







ඉන්පසු දෙවියන්
වහන්සේ රංචු පිටින්
මැස්සන් එවූ සේක.
එසේම උන්වහන්සේ
ඊජිප්තු ජාතිකයන්ගේ
ගවයින් විනාශ කරනු
පිණිස වසංගත
රෝග එවූ සේක.





දෙවියන් වහන්සේ, ඔවුන්ගේ
ශරීරවල වේදනාකාරී ගඩු
හටගැන්වූ සේක. මිනිස්සු
මහත් දරුණු ලෙස පීඩා
වින්දෝය. එහෙත් තව
දුරටත් ඵාරාවෝ
දෙවියන් වහන්සේට
කීකරු නොවූයේය.

ගඩු වසංගතයෙන් පසු, දෙවියන් වහන්සේ පළඟැටියන් රංචු වශයෙන් එවූ සේක. උන් දේශයේ තිබූ සියලු පැළෑටි කා දැමුවෝය.





ඉන්පසු දෙවියන්
වහන්සේ දින
තුනක් මුළු දේශයම
අදුරේ තැබූ සේක.
නමුත් මුරණ්ඩු ගති
ඇති ඵාරාවෝ
ඊශ්‍රායෙල්වරුන්
නිදහස්
නොකළේය.

“මම තවත් එක් වසංගතයක් එවන්නෙමි” යි දෙවියන් වහන්සේ අනතුරු හැඟවූ සේක. “මධ්‍යම රාත්‍රියේදී සියලු මිනිසුන්ගේ වැඩිමහල් දරුවාද, සතුන්ගේ වැඩිමහල් පැටවාද මිය යනු ඇත.” දෙවියන් වහන්සේ, ඔවුන්ගේ වැඩිමහල් දරුවා මිය නොයනු පිණිස, ඔවුන්ගේ නිවෙස්වල දොරේ කණුවල බැටළු පැටවෙකුගේ ලේ තවරන ලෙස ඊශ්‍රායෙල්වරුන්ට කී සේක.







මධ්‍යම රාත්‍රියේ මහා
හැඬීමක් ඊජිප්තු දේශයේ
විය. මරණය ඔවුන් සොයා
පැමිණියේය. හැම
නිවසකම අඩු තරමින්
එක් අයෙකුවත්
මියගොස් තිබුණි.





“පිටවෙලා යන්න” ඵාරාවෝ
මෝසෙස් ඉදිරියේ කන්නලව්
කළේය. “යන්න, දෙවියන්
වහන්සේට සේවය කරන්න”
ඉක්මනින්ම දෙවියන්
වහන්සේගේ ජනතාව
ඊජිප්තු දේශ සීමාවෙන්
පිටතට ඇවිද ගියෝය.



දෙවියන් වහන්සේ මෝසෙස්ට කතා
කොට පසුකර යාමේ රාත්‍රිය සිහිපත්
කරන ලෙස කීසේක. ඒ, දෙවියන් වහන්සේගේ දූතයා
ඊශ්‍රායෙල්වරුන්ගේ නිවෙස් පසුකර ගොස් ඵාරාවෝ
හා ඔහුගේ මිනිසුන්ට පහර දුන් බැවිනි.



ඊජිප්තු දෙශයේ අවුරුදු 430 ක්
විසීමෙන් පසුව දෙවියන් වහන්සේගේ
ජනතාව නිදහස් වූවෝය. දෙවියන් වහන්සේ දහවල්
කාලයේදී වලා ටැඹකින්ද රාත්‍රී කාලයේදී ගිනි
ටැඹකින්ද ඔවුන්ට මඟපෙන්වූ සේක.



නමුත් ඵාරාවෝ, ඔහුට
තවමත් ඊශ්‍රායෙල්වරුන්
සමඟ තිබූ ප්‍රශ්නය
හමාර කර තිබුනේ නැත.
නැවතත් ඔහුට දෙවියන්
වහන්සේව අමතක විය.
නැවතත් ඔහු හිත වෙනස්
කරගත්තේය. තම හමුදාව
රැස් කරගත් ඔහු වහලුන්
පිටුපස එළවා ගියේය.
ඉක්මනින්ම ඔහු, ඔවුන්ව
කඳු හා මුහුද අතර
කොටු කරගත්තේය.



“ස්වාමින් වහන්සේ ඔබ වෙනුවෙන් සටන් කරනු
ඇතැ” යි මෝසෙස් කීවේය. මෝසෙස් ඉදිරියට ගොස්
මුහුද අද්දර හිඳ, ඔහුගේ අත දිගු කළේය.



විශාල හාස්කමක්
සිදුවුණේය. දෙවියන්
වහන්සේ වතුර දෙබෑ
කර මුහුද මැදින්
මාවතක් සෑදූ සේක.
මිනිස්සු ආරක්ෂා
සහිතව එතෙර
වූවෝය.

එවිට  ඵාරාවෝගේ හමුදාවද රතු මුහුදට පැන්නෝය. “දැන් අපට ඔවුන් අල්වා ගත හැකිවේවි”යැයි සෙබළු සිතුවෝය. නමුත් දෙවියන් වහන්සේ නැවත වතුර එක්කළ සේක. ඊජිප්තු බලවත් හමුදාව මුහුදේ ගිලුනි. ඵාරාවෝ, ඊශ්‍රායෙල්හි දෙවියන් වහන්සේ සියල්ලන්ටම ඉහළ ස්වාමින් වහන්සේම බව ඒ මොහොතේ දැනගත්තේය.



ආයුබෝවන් ළාරාවෝ

**දේව වචනයෙන් එක් කථාවක්**

**බයිබලයේ**

නික්මයාම 4-15

**"ඔබේ වචන පැහැදිලි වන විට ආලෝකය ලැබේ"**
**ගීතාවලිය 119:130**

# අවසානය

මෙම බයිබල් කථාන්තරය අපට පවසනුයේ, අප සෑදූ අපගේ මහෝත්තම දෙවියන් වහන්සේ පිළිබඳ දැනගෙන උන් වහන්සේ කව්දැ යි කියා හඳුනාගන්නා ලෙසයි.

දෙවියන් වහන්සේ විසින් පාපය යයි සලකන, අයහපත් දේ අප විසින් කර ඇති බව උන් වහන්සේ දන්නා සේක. පාපයට දඬුවම මරණයයි. එහෙත් දෙවියන් වහන්සේ අපට බොහො සේ ප්‍රේම කරන බැවින් උන් වහන්සේගේ එකම පුත්‍රයා අප වෙත එවූ සේක. ජේසුස් වහන්සේ කුරුසියේ වද වේදනා විඳිමින් ඔබේ පව් උදෙසා මරණයට පත් වු සේක. ජේසුස් වහන්සේ මරණයෙන් නැඟිට, තමාගේ නිවස වන ස්වර්ගයට ගිය සේක. ඔබ ජේසුස් වහන්සේ පිළිගෙන ඔබගේ පාපයට කමාව අයැදින විට උන් වහන්සේ ඔබට කමාව දෙන සේක. එවිට උන් වහන්සේ ඔබ සමඟ ජීවත් වනු ඇත. ඔබට ද සදාකල්හිම උන් වහන්සේ සමඟ ජීවත් විය හැක.

මෙම සත්‍යය ඔබ පිළිගන්නේ නම් ජේසුස් වහන්සේට මෙසේ පවසන්න.

ආදරණීය ජේසුස් වහන්ස, ඔබ වහන්සේ, දෙවියන් වහන්සේ බව මම විශ්වාස කරමි. ඔබ වහන්සේ මිනිස් බව ගෙන මාගේ පාපය වෙනුවෙන් දිවි පුදා දැන් නැවතත් ජීවමානව වැඩසිටින සේක. මගේ ජීවිතයට පැමිණ මාගේ පාප කමා කරන මෙන් ඉල්ලා සිටිමි. එවිට මට ඔබ වහන්සේ සමඟ අලුත් ජීවිතයක් ගතකිරීමට හැකි ය. ඔබ වහන්සේ සමඟ සදාකාල ජීවිතයට ද මට දිනක් උදා වනු ඇත. ආමෙන්.

දිනපතා බයිබලය කියවා දෙවියන් වහන්සේ සමඟ කතා කරන්න (ශු. ජොහන් 3:16)